(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 3(7).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 ජූලි මස 01 වැනි සිකුරාදා

## 2011 ජූලි මස 19 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0449/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාණිජ බැංකු සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) පෞද්ගලික බැංකුවල කොටස් රජය මිලදී ගනිමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සේවක අර්ථසාධක අරමුදල මගින් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් මේ වනවිට පෞද්ගලික බැංකුවලින් රජය මිලදී ගෙන ඇති මුළු කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම එක් එක් බැංකුවෙන් මිලදීගත් කොටස්වල ප්‍රතිශතය සහ ඒ සඳහා වැය කළ සම්පූර්ණ මුදල එම මිලදීගැනීම සිදු කළ දිනයේ සිට එක් එක් වර්ෂයේදී, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොටස්වල මිල පහත වැටුනහොත් කොටස් මිලදීගැනීමේ අවදානම දරන්නේ කවරෙක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0862/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොත් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය නොහොත් ලේඛකාධාර ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භයේ සිට අද දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් වර්ෂය සඳහා රජයෙන් වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ආධාර ලබාගත් ලේඛකයින්ගේ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ දී එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය කවරේද;

(ii) ලේඛකයින්ට මහඟු අත්වැලක් වූ මෙම ව්‍යාපෘතිය වරින් වර අක්‍රියවීම්වලට ලක්වීම වළක්වා ගැනීම සඳහා ස්ථිර පදනමක් සකස් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1097/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා දකුණු පළාත් සභාව විසින් 2007 වර්ෂයේදී පවත්වන ලද තරඟ විභාගයේ ප්‍රතිඵල මත ගුරු පත්වීම් ප්‍රදානය කර තිබේද;

(ii) එසේ නම්, එම පත්වීම් ප්‍රදානය කළ දිනය කවරේද;

(iii) එම විභාගයේදී ප්‍රතිඵල අනුව එක් එක් උපාධිධාරියා විසින් ලබා ගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විභාගයේ ප්‍රතිඵල මත ගුරු පත්වීම් ලැබූවන්ගේ නම් සහ ඔවුන් ලබාගෙන තිබූ ලකුණු සංඛ්‍යාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත විභාගයේ ප්‍රතිඵල අනුව ගුරු සේවයට බඳවා ගැනීම සඳහා යෝජිතව තිබූ කොන්දේසි කවරේද;

(ii) පත්වීම් ප්‍රදානයේදී පෙර යෝජිතව තිබූ කොන්දේසිවල වෙනසක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම වෙනස් කිරීම් හේතුවෙන් ඉහත විභාගයේ ඉහළම ප්‍රතිඵල ලබා ගත් උපාධිධාරීන්ට සිදු වන අසාධාරණය වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1217/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1375/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි රංගිරි දඹුල්ල මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලක් බවත්;

(ii) එහි 2500 කට ආසන්න සිසුන් පිරිසක් අධ්‍යාපනය ලබන බවත්;

(iii) දැනට එම පාසලේ අඩු පාඩු රාශියක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ,

(i) අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව අනුව මේ වන විට අවශ්‍ය වී ඇති නව පන්ති කාමර 12 ක් ඉදිකිරීමටත්;

(ii) නර්තන/ සංගීත/ චිත්‍ර ඒකක පවත්වාගෙන යෑමට පහසුකම් සලසාදීමටත්;

(iii) ආරක්ෂිත තාප්පයේ ඉතිරි කොටස සකස් කර දීමටත්;

(iv) ක්‍රීඩා පිටිය ක්‍රමවත්ව සකස් කර දීමටත්;

(v) වැසිකිළි කැසිකිළි පද්ධතිය සකස් කර දීමටත්;

(vi) දරුවන්ට හා උපකරණවලට රිළවුන්ගෙන් සිදුවන හානිය වැළැක්වීමට පංති කාමර දැල් ගසා ආවරණය කිරීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේ නම්, ඉහත අඩු පාඩු සකස් කිරීමට ගතවන කාලය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1427/'11

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පළාත් සභා ආදායම් දෙපාර්තමේන්තු අයකරමින් තිබූ ව්‍යාපාර පිරිවැටුම් බද්ද 2011 අයවැය මගින් අහෝසිකිරීම හේතුවෙන් මේ වන විට පළාත් සභා ආදායම් දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරින්ට ඵලදායී රාජකාරියක් නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගේ නියෝගය පරිදි පළාත් ආදායම් සේවා ප්‍රශ්නය විසඳීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පත්කළ කමිටුව විසින් 2011.03.07 දින ලබාදී ඇති නිර්දේශය පරිදි පළාත් ආදායම් සේවා නිලධාරින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එසේ නොමැති නම්, දැනට කිසිදු රාජකාරියක් නොමැතිව පළාත් සභා ආදායම් දෙපාර්තමේන්තුවල සිටින, තරඟකාරී විභාගයක ප්‍රතිඵල මත පළාත් සභා ආදායම් දෙපාර්තමේන්තුවලට බඳවාගත් 372ක් වන උපාධිධාරී මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ගේ රැකියා ප්‍රශ්නය සම්බන්ධයෙන් රජය විසින් දෙනු ලබන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0768/'10

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 සිට 2010 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී දේශීය විශ්වවිද්‍යාලවලට බඳවා ගත් විදේශ සිසුන් සංඛ්‍යාව ඔවුන් අයත් රටවල් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් බඳවාගෙන ඇති අධ්‍යයන අංශ කවරේද;

(iii) ඉහත කී ශිෂ්‍යයන්ගෙන් වාර්ෂිකව ශ්‍රී ලංකාවට ලැබුන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දේශීය විශ්වවිද්‍යාලවලට වැඩි වශයෙන් විදේශ සිසුන් ආකර්ශණය කරගැනීම සඳහා විකල්ප වැඩ සටහනක් හඳුන්වා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දේශීය විශ්වවිද්‍යාල පද්ධතියට විදේශ සිසුන් බඳවා ගැනීම හේතුවෙන්, විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමේ අවස්ථාව අහිමිවූ දේශීය සිසුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ගැටලුව විසඳන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0985/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ත්‍රිකුණාමලය වරායේ ප්‍රයෝජනයට ගත හැකි යකඩ තොගයක් 2010 සැප්තැම්බර් මස මුල් කාලයේ දී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම යකඩ තොගය මිලදීගත් ආයතනය හෝ පුද්ගලයා කවරුන්ද;

(ii) එම යකඩවල බර ප්‍රමාණය කොපමණද;

(iii) එම යකඩ අලෙවියෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබුණු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලෙවිකරන ලද ඉහත යකඩ තොගය ඉවත් කරගැනීමේදී වරායට පිවිසීමේදී හා පිටවීමේදී ක්‍රියාත්මක කරන පිළිගත් ක්‍රමවේදයට අනුකූලව ක්‍රියාකර තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ ලියවිලි ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) මෙම ගණුදෙනුවේ දී මූල්‍ය වංචාවක් සිදු වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ නම්, එයට සම්බන්ධ වූ අයට එරෙහිව ගන්නා ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1218/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1377/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2001 වර්ෂයේදී ආරම්භ කළ මාතලේ සිරිමාවෝ බණ්ඩාරනායක ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයට අනුබද්ධව මේ වන විට ද්විතීයික අංශයක් ආරම්භ කර ඇති බවත්;

(ii) එම ද්විතීයික අංශය පිළිබඳව දෙමාපියන් අතර ගැටලු සහගත තත්වයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසලේ ද්විතීයික අංශය සඳහා ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ල පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ වන විට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණයෙන් නිම කර තිබේද;

(iv) ප්‍රාථමික අංශය හා ද්විතීයික අංශය අතර ඇති දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම අංශ දෙක අතර ඉදිවන ප්‍රවේශ මාර්ගයේ, පාලම ඉදි කිරීම, පඩි පෙළ සකස් කිරීම සහ මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීමට අදාළව වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් නියමිත ප්‍රමිතියෙන් පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසලේ ද්විතීයික අංශය වෙනත් නමකින් හැඳින්වීමට යෝජනාකර තිබේද;

(ii) එසේ නම්, ඒ නම කුමක්ද;

(iii) ද්විතීයික අංශය ආරම්භ කර ඇති ස්ථානයේ දරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0769/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තු සංඛ්‍යාව කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය සහ අදාළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iii) ඉහත සඳහන් පරිපූරක ඇස්තමේන්තුවලට අනුව වෙන්කරන ලද මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරිපූරක වියදම් කලින් සැලසුම් නොකිරීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පරිපූරක ඇස්තමේන්තුවල මුළු වටිනාකම සහ දළ දේශීය නිෂ්පාදිතයේ හිඟය අතර සන්සන්දනය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0986/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පොත් ප්‍රකාශන ඒකකයෙන් 2010 වර්ෂයේදී නිකුත් කර ඇති ග්‍රන්ථ කවරේද;

(ii) ඒ අතරින් අ.පො.ස. උසස් පෙළ භූගෝල විද්‍යා විෂයට අදාළව නිකුත්කර ඇති ග්‍රන්ථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රන්ථ අතර, අදාළ විෂය නිර්දේශය පාසල්වලින් ඉවත්කළ පසු නිකුත් කර ඇති ග්‍රන්ථ තිබේද;

(iv) එසේ නම්, එම ග්‍රන්ථයේ හෝ ග්‍රන්ථවල නම් කවරේද;

(v) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1219/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1378/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කේ (K) වර්ගයේ පාසල්වල විදුහල්පති තනතුර සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියෙහි නිලධාරීන් පත් කළ යුතු බවත්;

(ii) එසේ නොමැති අවස්ථාවල විදුහල්පති සේවයේ 2 ශ්‍රේණියේ අයෙකු පත් කළ යුතු බවත්;

(iii) එසේ වුවද, මාතලේ අධ්‍යාපන කලාපය තුළ K වර්ගයේ පාසල් කිහිපයක විදුහල්පති තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා ගුරු සේවයේ නියුතු අය පත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) K වර්ගයේ පාසැල්වල විදුහල්පති තනතුරෙහි වැඩ ආවරණය කිරීමට ගුරු සේවයෙහි අයකු පත් කිරීම අනුමත කරන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි පත්කිරීමක් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) දැනට (අ)(iii) හි සඳහන් පත්කිරීම් සිදු කර ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) විදුහල්පති සේවයෙහි 1 ශ්‍රේණියේ නිලධාරිණියකවූ අර්. එම්. යූ. එස්. එස්. රාජකරුණා මහත්මියට පාසලක් ලබා නොදී මාතලේ අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කොට සිටින බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, එම විදුහල්පතිතුමියට සාධාරණය ඉටු කිරීමට ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූලි මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0454/'10

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2010 ජුනි 8 සිට 10 දක්වා සිදු කළ ඉන්දීය සංචාරයේදී දමිළ ජාතිකයින් සඳහා නිවාස 50,000 ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවට රුපියල් බිලියන විසි හතරක් ප්‍රදානය කිරීමට ඉන්දීය රජය එකඟ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල් භාවිතා කරමින් අද වන විට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන සහ එම නිවාස ලබාදුන් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) නිවාස ඉදිකිරීමට පෙර ඉන්දියාව විසින් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස ලබා දීම සඳහා අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) ඔවුන් දමිළ ජාතිකයන්ද; මුස්ලිම් ජාතිකයන්ද; සිංහල ජාතිකයන්ද;

(iii) අවතැන් වූ සියලු පුද්ගලයන් පදිංචි කරවීම සඳහා නව නිවාස කොපමණ සංඛ්‍යාවක් ඉදිකිරීම අවශ්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0918/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සේනානිගල ප්‍රදේශයේ පදිංචි කිරීමට තීරණය කර ඇති ආදිවාසී පවුල් සංඛ්‍යාව;

(ii) මේ වන විට පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව;

(iii) එම පවුල්වලට අයත් පුද්ගලයින් සංඛ්‍යාව;

(iv) එක් පවුලක් සඳහා ලබා දීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය;

(v) මේ වනවිට ඔවුන්ට ලබා දී ඇති හෝ ලබා දීමට අදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආදිවාසී පවුල් වෙනුවෙන් සේනානිගල ප්‍රදේශයෙන් ලබාදීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය ඔවුන් වෙත ලබා නොදීමේ වැඩ පිළිවෙළක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1220/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා ප්‍රචෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජනමාධ්‍ය හා ප්‍රචෘත්ති අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0773/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010.06.29 දින නිකුත් කරන ලද මූල්‍ය කළමනාකරණ වාර්තාවට අනුව, ශ්‍රේලයින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමට රුපියල් මිලියන 400 ක බැංකු ඇපකරයක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බැංකු ඇපකරය ලබා දීමට හේතු කවරේද;

(ii) එමගින් ලැබුනු ප්‍රතිලාභය කවරේද;

(iii) එම වගකීම නිදහස් කරනු ලබන දිනය කවරේද;

(iv) සමුපකාර තොග වෙළඳ සංස්ථාව, රාජ්‍ය වෙළඳ සමාගම හෝ රාජ්‍ය වෙළඳ සමුපකාර තොග සමාගම වෙත ලබා දී ඇති රුපියල් මිලියන 4200 ක බැංකු ඇපකරය නිදහස් කර නොමැති වීමට හේතු කවරේද;

(v) ඉහත කී ඇපකරය පැවතීම හේතුවෙන් ලැබෙන ප්‍රතිලාභය කවරේද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ප්‍රමාණය තවදුරටත් වැඩි කරමින් ලංකා විදුලිබල මණ්ඩලය හා ආශ්‍රිත ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන 120 ක බැංකු ඇපකරයක් ලබා දී තිබේද;

(vii) මෙම තත්ත්වය නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(viii) රජය විසින් මහජන බැංකුවේ විශ්‍රාම අරමුදලෙන් මුදල් ලබා ගැනීමට හේතු කවරේද;

යන්න ඉහත සඳහන් වාර්තාවට අනුව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0987/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අවංක ක්‍රියාශීලී පොලිස් නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණින් 2005 වර්ෂයේ සිට මේ දක්වා ලබා දී ඇති මුදල් ත්‍යාග ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුණෙන් මුදල් ත්‍යාග ලබාදීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) එම දිරිගැන්වීම් නතර වීම හේතුවෙන් පොලිස් නිලධාරීන් අධෛර්යයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුදල් ත්‍යාග ලබා දීම නවතා දමා මේ වන විට ගතවී ඇති කාලය කොපමණද;

(ii) එම ත්‍යාග ලබා දීමට සුදුසුකම් ලබා සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන්ට ත්‍යාග ලබා දීමේ වැඩපිළිවෙළ නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1221/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0850/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජයට, පළාත් සභාවලට සහ නගර සභාවලට අයත් මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා 2006 සිට 2011 දක්වා වෙන්කරන ලද මුදල වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2006 සිට 2010 දක්වා, ඉහත සඳහන් ආයතන තුන විසින් සියලු ආකාරයේ මාර්ග සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) 2012 වර්ෂයේදී මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා වෙන් කිරීමට නියමිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අ(i) හි සඳහන් මාර්ග ඉදිකිරීම් සහ නඩත්තුව සඳහා වූ අරමුදල්වල මූලාශ්‍රයන් කවරේද;

(ii) එය ණය ප්‍රාග්ධනයක් නම්, ණය ගැනුම් පිරිවැය සහ ණය ලබාදුන් රටවල් හෝ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂවල නිමකරන ලද මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් රජය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක භාරකාර අරමුදලේ (ETF) මේ වන විට තැන්පත් කර ඇති මුදල;

(ii) එහි සාමාජිකත්වය ලබා ඇති සේවක සංඛ්‍යාව;

(iii) සාමාජිකයින්ගේ මුදල් වෙනුවෙන් ලබා දෙන වාර්ෂික පොලී අනුපාතය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මුදල් සාමාජිකයන්ට නැවත ලබා දීමේ වර්ෂ 5 කාල සීමාව දීර්ඝ කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි කාලය දීර්ඝ කිරීමක් සඳහා සැළැස්මක් සකසා තිබේද;

(iii) ඉහත (ආ) (i) හෝ (ii) සිදුකර ඇත්නම්, එයට හේතු වූ කරුණු කවරේද;

(iv) ඒ සඳහා කම්කරු උපදේශන සභාවේ අනුමතිය ලබාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙටි කාලීන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සේවක භාරකාර අරමුදලේ මුදල් භාවිතා කරන සේවකයින් මුහුණ දෙන ගැටලු සඳහා ලබා දෙන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1222/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූලි මස 21 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵලය කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0922/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ හයක කාලය තුළ බාල වර්ගයේ ඖෂධ ගෙන එන ලද සමාගම් ලෙස හඳුනාගෙන ඇති සමාගම් සංඛ්‍යාව කවරේද;

(ii) එම සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් සමාගම විසින් බාල වර්ගයේ ඖෂධ ගෙන ඒම නිසා රජයට සිදුවූ පාඩුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් සමාගම් විසින් රජයට ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාල වර්ගයේ ඖෂධ ගෙන ආ බවට හඳුනාගෙන ඇති එක් එක් සමාගමේ සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම සමාගම් අතුරින් මේ වන විට අපලේඛනගත කර (Black list), තහනම් කර ඇති සමාගම් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ සමාගම්වල නම් කවරේද;

(iv) ඉහත පරිදි තහනම් කර ඇති සමාගම්වලින් වර්ෂ 2006 සිට 2010 දක්වා කාල සීමාවේදී නැවත ඖෂධ මිලදී ගැනීම් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1223/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0851/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවල දේශීය සහල් පරිභෝජනය කොපමණද; සහ

(ii) 2011 සහ 2012 වර්ෂවල පරිභෝජනය සඳහා අවශ්‍යවේ යැයි ගණන් බලා ඇති සහල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 පෙබරවාරි මස සහල් මෙට්‍රික් ටොන් 100,000 ආනයනය කළ රජයේ ආයතනයන්හි නම් කවරේද;

(ii) ඉහත ආනයනයන් සඳහා මුදල් ලැබුනු මූලාශ්‍ර කවරේද; සහ

(iii) මෙසේ ආනයනය කරන ලද සහල්වල ආනයනික මිල, විකුණුම් මිල, අලෙවි කරන ලද ප්‍රමාණය සහ ගබඩා කර තිබෙන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑමයක මිල රු. 65/= ට වඩා වැඩියෙන් තිබියදී, මෙසේ ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 30,000ක් පමණ එක් කිලෝග්‍රෑමයක් රු. 31/= බැගින් 2010 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික අංශයට අලෙවි කර ඇති බවත්,

(ii) මෙම සහල් දේශීය වෙළෙඳපොළෙහි අලෙවි නොකරන ලෙසට රජය අවධාරණය කර තිබුණද, පෞද්ගලික වෙළෙඳුන් ඒවා දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) මෙසේ සහල් අලෙවි කළ පෞද්ගලික වෙළෙඳුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1001/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ රජයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරීන් සහ ඊට පහළ තනතුරුවල ස්ථිර සේවයේ නියුතු සේවක සංඛ්‍යාව;

(ii) ඔවුන් වෙනුවෙන් මාසිකව වැටුප් ලෙස ගෙවනු ලබන මුදල;

(iii) අතිකාල දීමනා ලෙස ගෙවනු ලබන මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) වර්ෂ 2010 නොවැම්බර් මාසයේ වැටුප සමඟ ඔක්තෝබර් මාසය වෙනුවෙන් ඔවුන්ට ගෙවනු ලබන අතිකාල දීමනා නොගෙවූ බවත්;

(ii) එවැනි තත්ත්වයක් යටතේ සේවකයින්ට තම වේතනය මාසිකව කළමනාකරණය කර ගැනීමේ දී ගැටලු ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එලෙස අතිකාල දීමනා ගෙවීම ප්‍රමාද වීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එම තත්ත්වය විසඳීම සඳහා කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1224/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජාතික උරුමයන් අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0852/'10

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව 2018 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට උත්සාහ කරන්නේද;

(ii) එසේ නම්, එම කාර්යය සඳහා සකස්කර ඇති සැලැස්ම කවරේද;

(iii) එම ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට අයදුම් කිරීමේදී අනුමතිය ලැබීම සඳහා වන මූලික වියදම කොපමණද;

(iv) මෙම කාර්යය සඳහා මූලික වී කටයුතු කරන පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියාකිරීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට පිරිනමනු ලැබුවහොත්, එම උත්සවය පැවැත්වීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්කයේ සහ නගරයේ නම් කවරේද;

(ii) ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) (i) සත්කාරක රට තෝරාගැනීමට නාමයෝජනා කැඳවූ විට ශ්‍රී ලංකාවේ නම යෝජනා කරන සහ ස්ථිර කරන රටවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාව හැරුණු විට 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවයේ සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට තරඟ කරන අනෙකුත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1002/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් විසඳුම් ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) විසඳුම් ලබා දීමට ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ අනුව වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1225/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණ ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූලි මස 22 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0562/'10

ගරු රවි කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියරේ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

(ii) එකී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන්ද;

(iii) එසේ නම්, එම ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කරන දිනය සහ අවසන් කරන දිනය කවරේද;

(ii) ඒ සඳහා මුදල් සම්පාදනය කරන්නේ කෙසේද;

(iii) පොලිය සහ ඉදිකිරීම් වියදමට අනුව සම්පූර්ණ පිරිවැය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ හය සඳහා වූ මුදල් ප්‍රවාහය පිළිබඳ පුරෝකථනය කවරේද;

(v) ප්‍රාග්ධනය සහ පොලිය සඳහා වන වියදම ද, අනෙකුත් මෙහෙයුම් වියදම් ද, ඉදිරි වර්ෂ දහය තුළ එක් එක් වර්ෂයේ දී ලැබීමට නියමිත ආදායම් ද ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ වරායෙන් ලැබෙන ආදායම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය ගෙවීම සඳහා යොදා ගන්නේද;

(ii) ණය මුදල ආපසු ගෙවීම ආරම්භවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0958/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2004.06.04 දිනැති අංක 1344 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අනුරාධපුර රාජධානි භූමියේ යාර 400 රෙගුලාසියට යටත්ව කිසිදු ඉදිකිරීමක් නොකළ යුතු බවට නීති සකසා තිබිය දී එයට පටහැනිව අනවසර ඉදි කිරීම් සිදු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ඉදිකිරීම් කවරේද;

(ii) ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එවැනි අවසරයක් ලබා දුන් නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර පූජා නගරයේ ඇතුළු දිය අගල කොන්ක්‍රීට් අතුරා සකස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සිදුකරනු ලබන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ද; නැතහොත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය මත වෙනත් පාර්ශ්වයක් විසින්ද;

(iii) වෙනත් පාර්ශ්වයක් විසින් නම්, ඒ කවරුන්ද;

(iv) එම ව්‍යාපෘතිය සිදු කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ජාතික උරුම නගරයක් වන අනුරාධපුර පූජා නගරය තුළ සිදු කරනු ලබන මෙවැනි අත්තනෝමතික ක්‍රියා සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/'11

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ස්ථිර නිෂ්පාදකවරයකු ලෙස පත් කරනු ලැබීමට අවශ්‍ය කරන මූලික සුදුසුකම කවරේද;

(ii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ දැනට සේවය කරමින් සිටින ස්ථිර නිෂ්පාදකවරුන් සංඛ්‍යාව කවරේද;

(iii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ දැනට සේවය කරමින් සිටින එක් එක් ස්ථිර නිෂ්පාදකවරයාගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1226/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණ ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0853/'10

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතීතයේ දී සහ වර්තමානයේ දී අපගේ සමහර ක්‍රිකට් ක්‍රීඩකයන් පදනම් විරහිත චරිත ඝාතනයන්ට ලක්වීමට හේතු කවරේද;

(ii) එම ක්‍රිකට් ක්‍රීඩකයන් ආරක්ෂා කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එමෙන්ම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය කවර හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයෙකුට එරෙහිව තරඟ පාවා දුන් බවට කිසියම් පැමිණිල්ලක් කර තිබේද;

(ii) දැනට එවැනි චෝදනා පිළිබඳ පරීක්‍ෂා කිරීම්වලට භාජනය වී ඇති ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රජය සහ 'ශ්‍රී ලංකා ක්‍රිකට්' ආයතනය අපේ ක්‍රිකට් ක්‍රීඩකයන් ආරක්‍ෂා කර ගනු පිණිස වඩා උනන්දුවකින් සහ කල් ඇතිව සිතා බලා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) අපගේ ක්‍රිකට් ක්‍රීඩකයන් ආරක්ෂා කර ගනු පිණිස ඉදිරියේදී ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(iii) අපගේ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ චරිතවලට හානි පමුණුවන අයුරින් කටයුතු කරන විදේශ මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන්ට එරෙහිව අපහාස කිරීමට අදාළ නඩු පැවරීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1014/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකාව ලෝකය තුළ ප්‍රචාරණය කිරීම සඳහා යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබේද;

(ii) එම මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ අනුව, එම වැඩසටහන සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ප්‍රචාරණ ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ආයතන අතරින් "බෙල්පොටින්ජර්" නම් බ්‍රිතාන්‍ය සමාගමක් එම වැඩසටහන ප්‍රචාරණය සඳහා ඇතුළත්කරගෙන තිබේද;

(ii) ඔවුන්ගෙන් ලබාගත් සේවාවන් කවරේද;

(iii) එම ආයතනය සඳහා ගෙවන ලද මුළු මුදල හා එක් එක් කාර්යය සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1227/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණ ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0989/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශයන්හිදී කටයුතු කිරීම සඳහා, විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් මහජන සම්බන්ධතා (PR) සමාගම් සමග ගිවිසුම්වලට එළඹී හෝ එබඳු සමාගම්වල සේවය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iii) එම සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹුනු දිනයන් කවරේද;

(iv) එම සමාගම් තෝරා ගන්නා ලද්දේ ටෙන්ඩර් පටිපාටියකට අනුවද;

(v) නොඑසේ නම්, එය ටෙන්ඩර් පටිපාටියකින් තොරව සිදු කිරීමට හේතු කවරේද;

(vi) එම එක් එක් සමාගම වෙත මාසිකව ගෙවනු ලබන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(vii) ඔවුන්ගේ සේවයෙන් අත්වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී විදේශයන්හිදී කටයුතු ඉටු කිරීම සඳහා තවත් මහජන සම්බන්ධතා සමාගම්වල සේවය ලබා ගන්නේද;

(ii) ශ්‍රී ලංකාව වෙනුවෙන් සේවය සලසන ඇමෙරිකා එක්සත් ජනපදයේ කර්විස්, එක්සත් රාජධානියේ බෙල්පොටෙන්ජර්, හා ඉන්දියාවේ ලෙක්සිකන් වැනි සමාගම් විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳ විස්තර කවරේද;

(iii) මෙම සමාගම්වල හිමිකරුවන්ගේ නම් කවරේද;

(iv) එම සමාගම් විදේශ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ කාර්යයේ නියැළීම සඳහාත් උත්සාහ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් කරන ලද පරිද්දෙන් අමාත්‍යාංශ සේවකයින්ට අයත් කාර්යභාරයන් අතරින් එක් කාර්යයක් බාහිර ආයතනවලට පැවරීම හේතුවෙන් එම සේවකයින් මන්දෝත්සාහී බවට පත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1015/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස ඉදිකිරීම් සඳහා වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම මුදලින් ග්‍රාමීය නිවාස, රජයේ නිවාස හා මහල් නිවාස ඉදිකිරීම සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස ව්‍යාපෘති සඳහා විවිධ රටවල්වලින් ණය හෝ ආධාර ලබාදී තිබේද;

(ii) එසේ නම්, ණය හෝ ආධාර ලබා දුන් රටවල් සහ එක් එක් රටෙන් ලබා දුන් මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1228/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණ ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?